# ප්‍රාදේශීය භාෂා හා උප භාෂා සම්බන්ධ පාරම්පරික දැනුම

පුරාණ කාලයේ සන්නිවේදනය සඳහා යොදා ගත් ප්‍රධාන මෙවලමකි ශිලා ලිපි. වර්තමානයේ භාවිතා කරන භාෂා විලාසය වදන් වැල ආදිය සැලකූ විට මෙම ශිලා ලිපි වල දක්නට ලැබෙන ලේඛන කලාවේ කැපීපෙනෙන වෙනස්කම් ඇත. කාලයත් සමඟ ඇතිවූ මෙම වෙනස්කම් සලකා මෙම ශිලා ලිපි භාෂා විලාසය ශ්‍රී ලංකාවේ දැනට පවතින භාෂාවේ උප භාෂාවක් ලෙස සැලකිය හැකිය.

භාෂාවක් බිහිවීමට පෙර එක් එක් ජන කණ්ඩායම් තම සන්නිවේදන කාර්යාවලිය සඳහා යොදාගත් එක් උපක්‍රමයකි සංකේත භාවිතය. අද වැනි දියුණු සමාජ ක්‍රමයක් පවතින කාලයක උවද විද්‍යාත්මක සාධක හා අනෙකුත් තාක්ෂණික ක්ෂේත්‍රවල විවිධ දෑ සන්නිවේදනය කිරීම සඳහා සංකේත යොදා ගනියි. තව ද ජපානය වැනි රටවල ඔවුන්ගේ සම්ප්‍රදායික ලේඛන කලාවේ එන ' කංජි ' ක්‍රමයේ දී විවිධ සංකේත රාශියක් භාවිතා කිරීමෙන් ලේඛන කලාව තුළින් සන්නිවේදන කාර්ය භාරය ඉටු කරයි. මේ අනුව භාෂාවක අක්ෂර වලට අමතරව සංකේත භාවිතා කිරීම නොදියුණු ගෝත්‍රික සමාජ සන්නිවේදන උපාය මාර්ගයක් ලෙස ඉවත හෙලිය නොහැක.

ලේඛන කලාවේදී ද විශේෂයෙන්ම ටැම් ලිපි වල සන්නිවේදනය සඳහා සංකේත භාවිතා කර ඇත. ප්‍රධාන වශයෙන් රූප සටහන් ලෙස පහත සඳහන් සංකේත යොදා ඇති බව පෙනේ.

i. බල්ලා හා කපුටාගේ රුව
ii. ඉර හා සඳ රූප
iii. රාජකීය සංකේතය (මෙය වටාපතක් ලෙස වරදවා සඳහන් කරන ස්ථාන ද ඇත.)
iv. රාජකීය මුද්‍රව හෙවත් අක්සන (මෙය නාගරුව හෝ දැකැති රුව යැයි වරදවා සඳහන් කරන ස්ථාන ද ඇත)

ටැම් ලිපි පමණක් නොව වෙනත් ආකාරයේ ශිලා ලිපි වලද සමහර ස්ථාන වලදී මෙම සංකේත දක්නට ලැබේ.

උදා:-

1. වැල්මිල්ල පුවරු ලිපියෙහි බල්ලකුගේ හා කපුටකුගේ රුවක් යොදාගෙන ඇත.
2. මහා පරාක්‍රම බාහු රජුගේ දෙවන ගල(පර්වත ලිපියේ) ශිලා ලිපියේ ඉර හා සඳ ලාංඡනය දක්නට ඇත.
3. දිඹුලාගල මාරවිදියේ පර්වත ලිපියේ ඉර හා සඳ රූ සටහන් දෙක දක්නට ලැබේ.

## බල්ලා හා කපුටාගේ රුව

අදහස් සන්නිවේදනය කිරීම ශිලා ලිපි වල රූ සටහනින් ඉදිරිපත් කිරීම මගින් බලාපොරොත්තු වී ඇත්තේ ඉදිරිපත් කරන අදහස පිළිබඳව ග්‍රාහකයාගේ දැඩි අවධානයක් ලබා ගැනීමයි. එලෙසම දුටු පමණින් ග්‍රහණය කරගත හැකි වීමයි. බලු කවුඩු රූප සටහන් යෙදීමට අමතරව ඇතැම් ටැම් ලිපි වල මේ ගැන ලිඛිතවම සඳහන් කර ඇත.

i. මේ ඇන්නෑ උලඝණ කල කෙනෙක් ඇත්නම් කවුඩු බලු වෙත්වා (මොරගොඩ ටැම් ලිපිය)
ii. මෙයම් උ(ල)ත්තා කල කෙනෙකුත් ඇත කවුඩු බලු වනුයි (නෑගම ටැම් ලිපි)
iii. (උල) ගනා කල (කෙ) නෙක් කවුඩු බලු වාහයි (මැදිරිගිරය ටැම් ලිපි)
iv. මෙයම් (අනියා) (කවුඩු) බලු (ඕලිබඳව ටැම් ලිපි)
v. මෙයම් අවුල් කල කෙනෙක් කවුඩු බලු වුහයි. (රඹදව ටැම් ලිපි)

මෙම ටැම් ලිපි වලින් දෙනලද ප්‍රදානයන් හෝ එහි පිළිපැදිය යුතු කරුණු උල්ලංඝනය කරන්නා කවරෙකු වුවද, බලු කවුඩු ලෙසින් මතු ආත්ම භවයන්හි උපත ලැබීමට තරම් පාප කර්මයක් කරන බව ප්‍රකාශ කිරීම යථෝක්ත සන්නිවේදන ක්‍රමෝපායන් අපේක්ෂිතය.

## ඉර හා සඳ රූ සටහන්

ඉර හා සඳ රූ සටහන් විශේෂයෙන්ම ටැම් ලිපි වල ද අනෙකුත් ශිලා ලිපි වලද දක්නට ලැබේ. මෙම ශිලා ලිපි වලත් දෙන දීමනාවක් දිගු කලක් තිස්සේ පවත්වාගෙන යායුතුයි යන්න මෙයින් සංකේතවත් කර සන්නිවේදනය කිරීම එහි අරමුණ වේ.

ටැම් ලිපි වලට අමතරව වෙනත් ශිලා ලිපි වලද සංකේත වලට අමතරව ලිඛිතව ඉහත සඳහන් සංකල්පය ඉදිරිපත් කර ඇත.

1. හෙයින් හිරිසන් ද පවත්නා (තෙක් සිටින) පරිද්දෙන් මෙග (ලැ) කොට දුන් ............ .

   (මහා පරාක්‍රම බාහු රජුගේ දෙවගල පර්වත ලිපිය)

2. (ග) නු ඉසා දිගු සියගට් හිරසන් ද ප(ම) (ණින) සම්ඩ් වැලන්දෙනු ඉසා ...

   (කෑගලු දිස්ත්‍රික්කයේ සැලව වෙලේ ගිරිලිපිය)

3. මේ කුඹුරේ හිරසන්ද් පමණින් පවත්නා කොඩ්

   (මැණික් දෙන පුවරු ලිපිය)

4. ගිරි සන්ද පමණින් රූ දහවල් සතකයෙන් ..........

   (වෙල්ගම් වෙහෙර පුවරු ලිපිය)

ටැම් ලිපි වලද ඉර හා සඳ රූ සටහන් කොටා තිබීම අනෙකුත් පුවරු ලිපි හා පර්වත ලිපි වලට වඩා සුවිශේෂී වූ සන්නිවේදන කාර්යයක් ඉටුකර ඇත. දිගු කලක් තිස්සේ මෙසේ මේ දීමනාවන් ස්ථිර සාරව පවත්වා ගැනීම කෙරේ ජනතාවගේ සහයෝගය ලබා ගැනීම පරමාර්ථ කරගත් එම ඉර හා සඳ රූ සටහන් යෙදූ ටැම් ලිපි කිහිපයක් පහත දැක්වේ

- මහා කස්සගේ සීගිරි ටැම් ලිපිය
- හතරවැනි දප්පුලගේ ඇල්ලේ වැව ටැම් ලිපිය
- අතුරු පොලයාගම ටැම් ලිපිය
- ඉගිනි මීටිය ටැම් ලිපිය
- කල්ලම් පත්තුව ටැම් ලිපිය

## රාජ්‍යත්වය පිළිබඳ සංකේතය

ප්‍රසාද ප්‍රදානයක් හෝ අනෙකුත් දීමනා සඳහා එක් තැන් සම්යෙන් ලැබුණු සම්මුතිය ලේඛන ගත කිරීමේදී සංකේත පාඨය ඇතුලත් කලද එය මහජනතාවට පහසුවෙන් ඇස ගැස්වීමට රාජ්‍යත්වය පිළිබඳ සංකේතය සන්නිවේදන මාර්ගයෙන් උපයෝගී කරගෙන ඇති බව විශ්වාස කෙරේ. ඒ අනුව රාජ සභාව හා රාජ බලය සංකේතවත් කරන රූ සටහන් ලෙසින් මෙය හඳුන්වා දිය හැකිය. මෙය සංකේතය මණ්ඩලාකාර වස්තුවක් (වටා පතක්) ලෙස සලකුණු කර ඇත.

රාජ සංකේතය හෙවත් සෝලිලිය ලෙසින් සඳහන් කරන එම වස්තුවේ ස්වරූපය දැක්වෙන ටැම් ලිපි වලට උදාහරණ කිහිපයක් දක්වා ඇත

i. කල්ලම් පත්තුවේ ටැම් ලිපිය

ii. තුණුකායි ටැම් ලිපිය

iii. මැදිරිගිරිය ටැම් ලිපිය

iv. මයිලස්තොට ටැම් ලිපිය

v. මහපා කස්සපගේ හල්බේ ටැම් ලිපිය

Vi. අතුරු පොලයාගම ටැම් ලිපිය

## රාජ මුද්‍රාව පිළිබඳ සංකේතය

සන්නිවේදන කාර්යයේදී විශේෂයෙන්ම රාජ්‍ය නියෝගයක් හෝ ආඥාවක් ජනතාව වෙත හා රට අදාල සෙසු නිළධාරින් වෙත සන්නිවේදනය කිරීමේ දී ද එය වගකිව යුත්තකුගේ ප්‍රකාශයක් ලෙස විශ්වාසනීයත්වයක් ඇති කල යුතුය. ඒ සඳහා ඉහත සඳහන් කල රාජ්‍යත්වය පිළිබඳ වූ එම සංකේතයට අමතරව රාජ මුද්‍රාවක් තැබීමෙන් රාජ ආඥාවක් බව ජනතාව සන්නිවේදනය කල අවස්ථා ටැම් ලිපි වල දැකිය හැකිය.

මෙම සංකේතය මවන දළ හැඩය ගැන පමණක් සැලකූ විට එය දැකැත්තක හැඩය ලෙසින් ද නාග සලකුණක් ලෙසින් ද සැලකූ අවස්ථා ඇත. රජුගේ පුද්ගලික ස්වහස්ත(අත්සන) යොදා අත්තානි දීමනාවක් සහතික කිරීම සඳහා ගලෙහි කෙටීම අපහසු නිසා ඒ වෙනුවට හංසයාගේ ශෛලගත දළ රූප සටහනක් කොටවා රාජ මුද්‍රාව සලකුණු කරන්නට ඇතැයි දැන් පිළිගැනේ.

සිරිමෙවන් ජයතුංග


